# මාවත්වාසී ළමයින්ගේ අපගාමී චර්යාවන් පිළිබඳ අධ්‍යයනයක්: කොළඹ කොටුව සහ පිටකොටුව ආශ්‍රයෙන්

නෙරංජි විජේවර්ධන
සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
*niranjiwijewardana@yahoo.com*

ලෝකයේ බොහෝ රටවල නාගරික ප්‍රදේශ ආශ්‍රිතව අයාලේ යාමට යොමු වී ඇති ළමා පරපුර සමාජ ප්‍රශ්නයක් බවට පත් වී තිබේ. සමාජ විද්‍යාත්මක ව්‍යවහාරය තුළ මෙම ළමයින් හැඳින්වෙන්නේ "වීදි දරුවන්" නොහොත් "මාවත්වාසී ළමයින්" *(Street Children)* වශයෙන්ය. මෙම අධ්‍යයනයේ මූලික ඉලක්කය වී ඇත්තේ මාවත්වාසී ළමයින් ලෙස ශ්‍රී ලංකාවේ මාවත් ආශ්‍රය කොට ගෙන ජීවත් වන සහ විවිධ ක්‍රියාකාරකම්වල නියුක්ත වී ඇති අපගාමී චර්යා රටාවන් කෙරෙහි නැඹුරු වී ඇති ළමයින් ඒ සඳහා යොමු වීමට හේතු සහ ඔවුන්ගේ අපගාමී චර්යා රටාවන් හඳුනා ගැනීමය.ඒ සඳහා අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස ශ්‍රී ලංකාවේ මාවත්වාසී ළමයින් බහුලවම ජීවත්වන්නා වූ නාගරික කොට්ඨාස ලෙස හඳුනා ගෙන ඇති කොළඹ කොටුව සහ පිටකොටුව ආශ්‍රිත පරිසරය අවධානයට යොමු වී ඇත. ලංකාවේ මෑතකාලීන මාවත්වාසී ළමයින් සම්බන්ධව කරන ලද අධ්‍යයනය ලෙස සැලකෙන්නේ, 2001 වර්ෂයේ ජාතික ළමාරක්ෂක අධිකාරිය *(National Child Protection Authority)* විසින් කරන ලද අධ්‍යයනයයි. එකී අධ්‍යයනයට අනුව, කොළඹ නගරයේ හඳුනාගෙන ඇති මාවත්වාසී ළමයින් සංඛ්‍යාව 538 කි. ජීවිතය පවත්වා ගෙන යාම සඳහා කුමන හෝ ආකාරයකින් මුදල් ඉපැයීම මෙම ළමයින්ගේ ප්‍රධාන අභිමතාර්ථයයි. එකී අභිමතාර්ථය සාධනය කර ගැනීම සඳහා සිදු කරන ක්‍රියාකාරකම් නීත්‍යානුකූලද නැද්ද යන්න පිළිබඳ ඔවුන්ට අදාළ නැත. මේ නිසාම, අපගාමී චර්යාවන්ට ඇති ප්‍රවේශයන් බහුලය. ඒ තත්ත්වය ඉතාමත් භයානක වන්නේ සමාජානුයෝජනය හරහා මොවුන් වැඩිහිටියන් වීමෙන් ඉක්බිති දරුණු ගණයේ අපරාධකරුවන් බවට පරිවර්තනය වීමේ ඉඩ ප්‍රස්තාවන් වැඩි හෙයිනි. මෙම ළමයින් කුමනාකාර කණ්ඩායමක්ද, ඔවුන්ගේ ස්වභාවය, සමාජ ආර්ථික තත්ත්වයන් ,දෛනික ක්‍රියාකාරකම්, මාවත් ආශ්‍රය කොට ගෙන ගොඩ නගා ගෙන ඇති සම්බන්ධතා ජාලය, පැවැත්ම සඳහා යොදා ගන්නා වූ උපාය උපක්‍රමයන්, එකී උපායන් ක්‍රමවේදයන් තුළ ඇති නීත්‍යානුකූල වන බව හෝ නොවන බව යනාදී වූ කාරණා පිළිබඳව නාගරික ප්‍රදේශය ආශ්‍රිත ළමයින් 256 ක් ආශ්‍රයෙන් මෙහි දී සාකච්ඡා වී තිබේ.

මෙම පර්යේෂණ පත්‍රිකාව තුළ අධ්‍යයන ක්ෂේත්‍රය ආශ්‍රිතව නිරීක්ෂණය, ප්‍රශ්නාවලිය, සම්මුඛ සාකච්ඡා, සිද්ධි අධ්‍යයනයන්ගෙන් ලබා ගත් තොරතුරුත් ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දත්ත විශ්ලේෂණයන් පදනම් කර ගනිමින් එළඹෙන ලද පර්යේෂණ ප්‍රතිඵලත් ඇතුළත්ය.

***ප්‍රමුඛ පද:*** *මාවත්වාසී ළමයින්, අපගාමී චර්යා රටාවන්, සමාජානුයෝජනය, අපරාධකරුවන්*